කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

ආරක්ෂක සේවය සහ පවිත්‍රතා සේවය සැපයීම සඳහා 2027 වර්ෂය වෙනුවෙන් ලංසු දැන්වීමයි

2027 වර්ෂය සඳහා සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ රත්මලාන ප්‍රධාන කාර්යාලය, කළුතර සහ වගවත්ත-හොරණ ප්‍රාදේශීය කාර්යාල සඳහා ආරක්ෂක සේවය සහ පවිත්‍රතා සේවය සැපයීම පිණිස සැපයුම්කරුවන් වෙතින් ලංසුපත් කැඳවනු ලැබේ.

පහත සුදුසුකම් සහිත ආයතන වලට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

1. 2007 අංක 07 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සමාගමක් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ලියාපදිංචි තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර යටතේ ලියාපදිංචි පවිත්‍රතා හෝ ආරක්ෂක සේවා සැපයීමේ ආයතනයක් ලෙස ලියාපදිංචි වී වසර 05 ක කාලයක් සේවා සපයා ඇති ආයතනයක් විය යුතුය.
2. 2026.11.23 දින සිට සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව.09.00 සිට 2026.12.07 දින පෙ.ව.10.00 දක්වා පවිත්‍රතා සේවය සඳහා සහ පෙ.ව.11.00 දක්වා ආරක්ෂක සේවය සඳහා ලිපිනයේ සඳහන් ප්‍රධාන කාර්යාලය මඟින් අදාළ තොරතුරු හා ලංසුපත් ලබාගත හැක.අයදුම්පත් ලබා ගැනීමේදී එක් එක් අයදුම් පත්‍රයක් සඳහා වෙන වෙනම ආපසු නොගෙවනු ලබන රු.2,500/- ක මුදලක් ගෙවීම් කළ යුතු වේ.අයදුම්පත්‍ර භාරදීමේ දී ආයතනයේ සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) වෙත මුදල් ගෙවා ලබාගත් ලදුපත සහ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

i. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය
ii. වසර 05 ක පලපුරුද්ද පිළිබඳ සේවා සහතිකය
iii. ආරක්ෂක අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ද්විවාර්ෂික බලපත්‍රය (ආරක්ෂක සේවය)

3. පවිත්‍රතා සේවය සඳහා පූර්ව ප්‍රසම්පාදන කමිටු රැස්වීම 2026.11.30 දින පෙ.ව. 10.00ට සහ ආරක්ෂක සේවය සඳහා පූර්ව ප්‍රසම්පාදන කමිටු රැස්වීම 2026.11.30 දින පෙ.ව. 11.00 ට, සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම, නො.446, ගාලු පාර, රත්මලාන ලිපිනයේ දී පැවැත්වේ.
4. සම්පූර්ණ කරන ලද පවිත්‍රතා සේවය සඳහා වන ලංසු ලියවිලි 2026.12.08 දින පෙ.ව. 10.00 ට පෙරත්, ආරක්ෂක සේවය සඳහා වන ලංසු ලියවිලි 2026.12.08 දින පෙ.ව.11.00 ට පෙරත් ආයතනයේ ප්‍රසම්පාදන මණ්ඩල සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැක.ටෙන්ඩර්පත් එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “2027 වර්ෂය සඳහා ආරක්ෂක සේවය සැපයීම” හෝ “2027 වර්ෂය සඳහා පවිත්‍රතා සේවය සැපයීම” යනුවෙන් සඳහන් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. 2026.12.08 දින පෙ.ව.10.00 ට පවිත්‍රතා සේවය සහ පෙ.ව.11.00 ට ආරක්ෂක සේවය සැපයීම සඳහා ලංසුපත් විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය.
6. අදාළ ලංසුපත් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව (කුඩා),
සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම,
L 3, නො.446, ගාලු පාර,
රත්මලාන
දුරකථන අංක – 0112437557/011234465
වෙබ් – pccl.lk